1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
# பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
# CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref. CSS/7/1/4 | ඔබේ අංකය / உனது இல / Your Ref. | දිනය / திகதி / Date 2023.03. 11 |

<u>ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 01/2023</u>

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් සහ
ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>2023 වර්ෂය සඳහා වෙන් කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 6 කින් කපා හැරීම හා රජයේ වියදම් කළමනාකරණය</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කර ඇති අංක DMA/AMC/M/2023/02 දරන 2023.03.03 දිනැති ලිපිය හා බැඳේ. (එම ලිපියේ පිටපත මේ සමඟ අමුණා ඇත.)

02. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති 2023.01.27 දිනැති, අංක 01/2023 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙහි සඳහන් විධි විධාන සහ සකසුරුවම් ලෙස වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රමවේද ක්‍රියාත්මක වන බවට තහවුරු කර ගැනීමට, ආයතනයේ පැවැත්වෙන සෑම විගණන හා කළමනාකරණ කමිටුවකදී ම කටයුතු කළ යුතු බව චක්‍රලේඛයේ 6 (ඉ) ඡේදය මඟින් අවධාරණය කර ඇති බවට එම ලිපිය මඟින් පෙන්වා දී ඇත.

03. ඒ අනුව, මේ සමඟ වන ඇමුණුම 01 ට අනුව තොරතුරු විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර අපේක්ෂිත ඉතිරි කිරීම සත්‍ය වශයෙන් සිදුවන්නේ ද? යන්න හා යම් යම් බැහැරවීම් තිබේ නම්, ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග විගණන හා කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කොට කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බවත්, මෙම කරුණ විගණන හා කළමනාකරණ කමිටු න්‍යාය පත්‍රයේ අනිවාර්ය අංගයක් වශයෙන් සාකච්ඡාවට බඳුන් කරන ලෙසත් දන්වා ඇත.

04. එබැවින්, ඔබ ආයතනය/ යටත් ආයතන තුළ පැවැත්වෙන විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වල දී ඉහත උපදෙස් ප්‍රකාර කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, දකුණු පළාත. - දැ.ගැ.පි.
2. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය, දකුණු පළාත. - දැ.ගැ.පි.
3. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීමට

දුරකථන : 091-4944007    ෆැක්ස් : 091-2232691    විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com

# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
செயலகம், கொழும்பு 01

MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES
The Secretariat, Colombo 01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DMA/AMC/M/2023/02 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2023.02.03 |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>2023 වසර සඳහා වෙන්කර ඇති පුනරාවර්තන ප්‍රතිපාදන සියයට 6 කින් කපාහැරීම හා රජයේ වියදම් කළමනාකරණය</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.01.27 දිනැති අයවැය චක්‍රලේඛ අංක: 01/2023 හා බැඳේ.

02. එකී චක්‍රලේඛයේ දක්වා ඇති විධි විධාන හා සකසුරුවම් ලෙස වියදම් කළමනාකරණය කිරීමේ ක්‍රම වේද ක්‍රියාත්මක වන බව තහවුරු කරගැනීමට චක්‍රලේඛයේ 6(ඉ) ඡේදය මගින් ආයතනයේ පැවැත්වෙන සෑම විගණන හා කළමණාකරණ කමිටුවකදීම කටයුතු කළ යුතු බව අවධාරණය කර ඇත.

03. ඒ අනුව මෙහි ඇමුණුම 01 ට අනුව තොරතුරු විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර අපේක්ෂිත ඉතිරිකිරීම් සත්‍ය වශයෙන් සිදුවනවාද යන්න හා යම් යම් බැහැරවීම් තිබෙනම්, ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. තවද මෙම කරුණ විගණන හා කළමනාකරණ කමිටුවේ න්‍යාය පත්‍රයේ අනිවාර්ය අංගයක් ලෙස සාකච්ඡාවට බඳුන් කරන ලෙස ද කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක

අධ්‍යක්ෂ ජනරාල්

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | 2484816<br>2484500<br>2484600<br>2484700 | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | 2484543 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2449496 | වෙබ් අඩවිය<br>வெப் சைட்<br>website | www.treasury.gov.lk |

ඇමුණුම 01

# අය වැය චක්‍රලේඛ 01/2023 අනුව වියදම් කළමනාකරණය

ආයතනයේ නම :-

වැය ශීර්ෂය :-

වැඩ සටහන :-

ව්‍යාපෘතිය :-

රු. ", 000"

| වැය විෂය | 2023 ඇස්තමේන්තුව | යෝජිත 6% ප්‍රතිපාදන කපා හැරීමේ ප්‍රමාණය | සංශෝධිත ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුවට අනුව පුරෝකථනය කළ වියදම හා සත්‍ය වියදම | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 1 වන කාර්තුව | | | 2 වන කාර්තුව | | | 3 වන කාර්තුව | | | 4 වන කාර්තුව | | |
| | | | | | ජන | පෙබ | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොවැ | දෙසැ |
| | | | | පුරෝකථනය | | | | | | | | | | | | |
| | | | | සත්‍ය | | | | | | | | | | | | |
| | | | | පුරෝකථනය | | | | | | | | | | | | |
| | | | | සත්‍ය | | | | | | | | | | | | |
| | | | | පුරෝකථනය | | | | | | | | | | | | |
| | | | | සත්‍ය | | | | | | | | | | | | |
| | | | | පුරෝකථනය | | | | | | | | | | | | |
| | | | | සත්‍ය | | | | | | | | | | | | |